# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS


2025.04.29

## මාධ්‍ය නිවේදනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2025

## තැපැල් ඡන්ද විමසීම සාමකාමීව අවසන්

2025 මැයි මස 06 වන දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාල තැපැල් ඡන්ද සළකුණු කිරීම් අවසන් දිනය අදයි. මෙවර තැපැල් ඡන්ද අයදුම් කළ පිරිස 663,499 කි. එකී අයදුම්කරුවන් අතුරින් ප්‍රතික්ෂේප කළ ප්‍රමාණය 15,010 කි. ඒ අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා සුදුසුකම් ලත් තැපැල් ඡන්ද හිමියන් ප්‍රමාණය 648,489 වන අතර වැඩිම තැපැල් ඡන්ද දායකයින් ප්‍රමාණය සිටින දිස්ත්‍රික්කය වන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කය වන අතර එම ප්‍රමාණය 71,228 කි.

**තැපැල් ඡන්ද විමසීම සඳහා කලින් සැලසුම් කල දින වෙනස් වේ**

පළාත් පාලන ආයතන ගණනාවක නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප වීම නිසා අගතියට පත් පාර්ශවයන් විසින් අධිකරණ ක්‍රියාමාර්ග වලට යොමුව තිබුනි. ඒ අනුව ඡන්ද විමසීම වළක්වාලමින් අතුරු තහනම් නියෝගයක් පනවා තිබීම නිසා තැපැල් ඡන්ද පත්‍රිකා මුද්‍රණය යම් තරමකින් ප්‍රමාද වන තත්ත්වයක් නිර්මාණය විය. කෙසේ නමුත් අදාල නඩු තීන්දු අධ්‍යනය කරමින් පියවර කිහිපයකින් තැපැල් ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීමට මැතිවරණ කොමිෂන් සභාව කඩිනමින් පියවර ගත් අතර රජයේ මුද්‍රණාලයද ඊට විශාල සහයෝගයක් ලබාදෙමින් තැපැල් ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීමට කඩිනමින් පියවර ගෙන තිබුනි. ඒ අනුව තැපැල් ඡන්ද විමසීමේ දින ලෙස මුලින් නියම කර තිබූ අප්‍රේල් 22,23,24 සහ 28, 29 දින සංශෝධනය කරන ලදී.

කෙසේ නමුත් අධිකරණ ක්‍රියාමාර්ග අවසානයේදී කල් දැමීමකින් තොරව සියලු පළාත් පාලන ආයතන ඡන්ද විමසීම මුලින් සැලසුම් කළ පරිදි පළාත් පාලන ආයතන 339 හිම පැවැත්වීමට අවකාශය සැලසුනි. ඉන් අනතුරුව අධිකරණ ක්‍රියාමාර්ග සඳහා යොමුවූ පළාත් පාලන ආයතනද තැපැල් ඡන්ද විමසීම ක්‍රියාවලියට දායක කරගැනීමේ අරමුණින් යුතුව මුලින් සැලසුම් කළ තැපැල් ඡන්ද දින වකවානු වෙනස් කළ අතර පසුව තැපැල් ඡන්ද විමසීමේ දින වකවානු අප්‍රේල් 24,25,28 හා 29 යන දිනවලට සංශෝධනය විය. ඒ අනුව සියලුම රාජ්‍ය ආයතන, පොලීසිය, ත්‍රිවිධ හමුදා කඳවුරු, අධ්‍යාපන කාර්යාල සංස්ථා මණ්ඩල ඇතුලු සියලුම රාජ්‍ය ආයතන සඳහා කිසිදු වෙනසකින් තොරව දින 04 දීම තමන්ට අයත් කාර්යාල වලදී තැපැල් ඡන්ද සළකුණු කිරීමට ඉඩ ප්‍රස්ථාව සලසා දෙනලදී.


#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.

Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572

Email : paffrel@sltnet.lk Web : www.paffrel.com

**මහනුවර දළදා වන්දනාවේ විශේෂ රාජකාරී නියුතු ආරක්ෂක නිලධාරීන්ට විශේෂ තැපැල් ඡන්ද මධ්‍යස්ථාන 2 ක්**

මහනුවර සිරි දළදා වන්දනාව වෙනුවෙන් විශේෂ රාජකාරී වල නිරත පොලිස් සහ හමුදා නිලධාරීන් වෙනුවෙන් සිය තැපැල් ඡන්දය සලකුණු කිරීම සඳහා විශේෂ තැපැල් ඡන්ද මධ්‍යස්ථාන දෙකක් සැලසුම් කිරීමට මැතිවරණ කොමිසම පියවර ගෙන තිබුණි. ඒ අනුව මහනුවර උසස් බාලිකා විද්‍යාලය සහ 2 වන ස්වේච්ඡා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථාන ඉහත දින 4 තුළම දිස්ත්‍රික් 25 ආවරණය වන පරිදි තැපැල් ඡන්ද සළකුණු කිරීමට අවකාශය සලසා දීම විශේෂත්වයකි. ඒ අනුව බාධාවකින් තොරව දළදා වන්දනාවේ ආරක්ෂක රාජකාරී වල නියුතු පොලිස් හා හමුදා නිලධාරීන්ගේ ඡන්ද අයිතිය සුරක්ෂිත කිරීමට ගන්නා ලද කඩිනම් පියවර පිළිබඳව මැතිවරණ කොමිසමට ප්‍රසංසාව හිමි විය යුතුය.


**තැපැල් ඡන්ද විමසුම සාමකාමීව අවසන්.**

අප්‍රේල් 24, 25, 28 සහ 29 යන දින වල පැවති තැපැල් ඡන්ද විමසීම විශේෂ සිදුවීම් වලින් තොරව අවසන් කරන්නට හැකි වීම පසුගිය මැතිවරණ දෙකෙහි අප දුටු යහපත් මැතිවරණ සංස්කෘතියේ ඉදිරිගාමී පියවරක් බවට විවාදයක් නැත. ඡන්දය ප්‍රකාශ කිරීමද ප්‍රශස්ථ මට්ටමක පැවති අතර තැපැල් ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරීන් කිහිප දෙනෙකුගේ සුලු අතපසුවීම් කිහිපයක් හැරුණු කොට විශේෂ ගනයේ සිදුවීම් වාර්තා නොවීය. නමුත් බොහෝ ස්ථාන වල දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරමින් පක්ෂ නියෝජිතයන් සම්බන්ධ කර නොතිබීම බලවත් අඩුපාඩුවක් බව අපගේ විශ්වාසයයි. ඒ පිළිබඳව දේශපාලන පක්ෂ ගැඹුරින් සිතා බැලිය යුතු බව අප යෝජනා කරමු.

තැපැල් ඡන්ද විමසීම සාමකාමීව නිමා කරන්නට දායක වූ මැතිවරණ කොමිසම් සභාව, පොලිස් දෙපාර්තමේන්තුව, විවිධ රාජ්‍ය ආයතන හා මැතිවරණ නිරීක්ෂණ සංවිධාන වලට අපගේ ස්තූතිය පුද කර සිටිමු.

මෙයට,

විශ්වාසී,



රෝහණ හෙට්ටිආරච්චි

විධායක අධ්‍යක්ෂ